රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 10/2000

මගේ අංකය : IX ටියු 11
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

2000.03.30

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ
රාජ්‍ය සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩල සභාපතිවරුන් වෙත.

# උපදේශක සභා පිහිටුවීම.

සියළුම අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා රාජ්‍ය සංස්ථා/ව්‍යවස්ථාපිත මණ්ඩලවල උපදේශක සභා අප්‍රමාදව පිහිටුවිය යුතුයැයි අතිගරු ජනාධිපතිතුමිය උපදෙස් දී ඇත. මේ පිළිබඳව මීට පෙර උපදෙස් ලබාදී ඇතත්, සමහර ආයතන නිසි පරිදි එම උපදෙස් ක්‍රියාත්මක කර නැති බවට නිරීක්ෂණය වී ඇත.

02. උපදේශක සභාවලින් ඒ ඒ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා සංස්ථාවල :

- කාර්යක්ෂමතාවය හා ඵලදායීතාවය වැඩි දියුණු කර ගැනීම
- දූෂණය හා නාස්තිය වළක්වා ගැනීම
- සංවර්ධන කටයුතු කඩිනම් කර ගැනීම
- නව සංවර්ධන අදහස් හා යෝජනා ඉදිරිපත් කිරීම හා සැලකිල්ලට ගැනීම
- මහජන කටයුතු අප්‍රමාදව ඉටුකිරීම
- සේවකයින්ගේ අදහස් හා යෝජනා සැලකිල්ලට ගැනීම
- අභ්‍යන්තර සේවා කුසලතාවයන් සංවර්ධනය කර ගැනීම
- සේව්‍ය සේවක සම්බන්ධතා ශක්තිමත් කර ගැනීම
- සම්පත් උපරිම ආකාරයෙන් පාවිච්චි කර අවශ්‍ය ආයතනික වර්ධනය හා කාර්යක්ෂමතාවය වැඩි දියුණු කර ගැනීම

යනාදී කරුණු ඉටු කරගැනීමට බලාපොරොත්තු වන බැවින්, උපදේශක සභා පිහිටුවීමේ වැදගත්කම මෙයින් අවධාරණය කරණු ලැබේ.

03. උපදේශක සභා පිහිටුවීමේ අරමුණ, සංයුතිය හා ක්‍රියාකාරීත්වය පිළිබඳව විස්තර ඇමුණුම 01 න් දක්වා ඇත. එහි සඳහන් උපදෙස් පරිදි ඔබේ ආයතනයේ උපදේශක සභා පිහිටුවා එම උපදේශක සභා රැස්වීම් මාසිකව පැවැත්වීමට අවශ්‍ය විධිවිධාන යෙදිය යුතුය. දැනටමත් පිහිටුවා ඇති උපදේශක සභා මෙම උපදෙස් ද අනුගමනය කරමින් ඉදිරියට පවත්වා ගෙන යා යුතුය.

04. උපදේශක සභා විසින් අවධානය යොමු කළයුතු කරුණු ඇමුණුම 02 හි දක්වා ඇත.

**05.** **2000.04.10** දිනට ප්‍රථම උපදේශක සභා පිහිටුවීමේ කටයුතු නිමකොට ප්‍රගතිය ජනාධිපති ලේකම් කාර්යාලයේ ප්‍රතිපත්ති පර්යේෂණ හා තොරතුරු ඒකකය වෙත වාර්තා කළ යුතුය.

**06.** මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලබන්නේ ජනාධිපති ලේකම් කාර්යාලයේ ප්‍රතිපත්ති පර්යේෂණ හා තොරතුරු ඒකකයේ එකඟතාවය මත වේ.

( මහින්ද බන්දුසේන )
ලේකම්,
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

Contd